ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව - **2016**

---

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් සහ වියදම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2 මූල්‍ය ප්‍රකාශන

---

## 2.1 මතය ව්‍යාවනය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02

(i) සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන ප්‍රදාන සහ අමාත්‍යාංශ ප්‍රදාන පිළිවෙලින් රු.145,000,000 ක් සහ රු.7,298,213 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්වීම වෙනුවට ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් ස්ථාවර වත්කම්වල වටිනාකම රු.27,439,483 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ එය රු.42,626,212 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුදල් ගලායාම් රු.15,186,729 ක් වැඩියෙන් දක්වා තිබුණි. මෙම මුදල, මුදල් වැය කිරීමකින් තොරව අත්පත් කරගෙන තිබූ වත්කම්වල වටිනාකම බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වියදම රු.21,996,817 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ එය රු.21,575,359 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය රු.421,458 කින් අඩුවෙන් දක්වා තිබුණි. කාරක ප්‍රාග්ධන වෙනස්වීම් යටතේ දක්වා තිබූ වෙළඳ ගෙවිය යුතු දෑ වලට මෙම වටිනාකම් ගලපා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

වත්කමක සාධාරණ වටිනාකමෙහි සැලකිය යුතු නොවන තරමේ වෙනස්වීම් ඇතිවිට, වත්කම් සෑම වසර 3 කට හෝ වසර 5 කට වරක් ප්‍රත්‍යාගණනය කිරීම ප්‍රමාණවත් වුවද, සංස්ථාව විසින් 2007 වර්ෂයෙන් පසුව වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාව විසින් රාජ්‍ය ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් සහ ක්‍රමක්ෂය ගැලපීමට අදාළව අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 68 වගන්තිය ප්‍රකාරව, වත්කම් භාවිතයට සුදුසු තත්ත්වයට පත්වූ දින සිට ක්ෂය කිරීම ආරම්භකළ යුතු වුවත්, සංස්ථාව විසින් ඊට පටහැනිව වත්කම් මිළදීගත් වර්ෂයේදී සම්පූර්ණ වර්ෂයටම ක්ෂය කිරීම හා විකුණන වර්ෂය සඳහා ක්ෂය නොකිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුගමනය කර තිබුණි.

(ඇ) වත්කම්වල ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන වාර්ෂික ක්ෂය අනුපාතය තීරණය කළයුතු වුවත්, සංස්ථාව විසින් තාක්ෂණික හේතූන් මත සීඝ්‍රයෙන් යල්පැනීමට ලක්වන පරිගණක උපාංග සඳහා වූ ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගැනීමෙන් තොරව වසර 10 ක කාලයක් සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර තිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන මගින් අඩමාණ ණය වෙන්කිරීම ගිණුම්ගත කිරීම හෙළිදරව් කර තිබුණද ණයගැතියන් ගෙන් අඩමාණ ණය සඳහා වෙන්කිරීම් ප්‍රමාණය හඳුනාගන්නා ආකාරය ප්‍රතිපත්තියට ඇතුළත් කර නොතිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා අඩමාණ ණය ලෙස රු.11,008,838 ක් වෙන්කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි සිට 2013 ජූලි දක්වා ජීවන වියදම් දීමනාව සඳහා දායක මුදල් නොගෙවීම හේතුවෙන් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට ගෙවිය යුතු රු.5,110,189 ක අධිභාරය වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සළසා නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ඇණවුම් කර තිබූ රු.මිලියන 28 ක යන්ත්‍රයකට අදාළව රු.8,800,000 ක් සමාලෝචිත වර්ෂයේ ජංගම නොවන වත්කම් ලෙස දක්වා ගෙවිය යුතු වියදම්වලට බැර කර තිබුණි. ඒ අනුව ගෙවිය යුතු වියදම් එම වටිනාකමින් ද සමාලෝචිත වර්ෂයේ අලාභය රු.880,000 කින් හා ස්ථාවර වත්කම් ශුද්ධ අගය රු.7,920,000 කින් ද වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවෙහි අරමුදල් මත එම දෙපාර්තමේන්තුවෙහි සේවකයන්ගේ භාවිතය සඳහා වරාය භූමියේ ස්ථාපනය කර ඇති රු.7,169,938 ක වටිනාකමක් සහිත කන්ටේනර් කාර්යාල 10 ක්, සංස්ථාවට පවරා නොතිබියදී , එම වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ දක්වා රු.1,433,988 ක ක්ෂය ප්‍රතිපාදන සිදුකර තිබුණි.

(ඈ) 2015 හා 2012 වර්ෂවල මිලදීගෙන තිබූ බීකන් ලාම්පුවලට අදාළ ක්ෂය රු.217,000 ක් අඩුවෙන් සහ එම හේතුවෙන් ස්ථාවර වත්කම්වල ශුද්ධ අගය එකී ප්‍රමාණයන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස දැක්විය යුතු වුවත් එය ජංගම වත්කම්වල අත්තිකාරම් යටතේ දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට ධීවර වරායන් 22 ක භෞතික ඉන්ධන තොගය සහ පොත් අගය අතර එකතුව රු. 7,968,739 ක වෙනසක් පැවතුණු අතර වෙනසට හේතු විගණනයට ඉදිරිපත් නොකෙරුණි .

(ආ) සමාලෝචිත වර්ෂයේ ධීවර වරායන් 03 කට අදාළ මුළු වියදම සම්බන්ධයෙන් ලෙජර ගිණුම සහ මූල්‍ය ප්‍රකාශන අතර රු.253,101 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ ජංගම බැංකු ගිණුම් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශන වලට අනුව බැංකු ශේෂය හා මුදල් පොත්වල දැක්වෙන ශේෂයන් අතර රු.15,901,732 ක වෙනසක් විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| ස්ථාවර වත්කම් | 5,008,512,962 | ස්ථාවර වත්කම් ලේඛනය, භාණ්ඩ සමීක්ෂණ වාර්තා |
| හඳුනානොගත් ලැබීම් | 2,215,769 | විස්තරාත්මක උපලේඛන |
| තැන්පතු | 6,335,900 | |
| විලම්භිත වගකීම් | 1,653,400 | |
| ලියාහැරිය යුතු ශේෂ | 81,769,596 | |
| කෙරීගෙන යන වැඩ | 24,572,784 | |
| ණයගැති ශේෂය | 350,780,522 | කාල විශ්ලේෂණ , ශේෂ සනාථන |
| රඳවා ගැනීමේ බදු | 2,526,034 | |
| ණය හිමියෝ සහ අත්තිකාරම් | 111,954,599 | කාල විශ්ලේෂණ හා විස්තරාත්මක උපලේඛන සහ යාවත්කාලීන කරන ලද ලේඛන |
| අමාත්‍යාංශ අරමුදල | 129,101,563 | |
| JICA අරමුදල | 19,992,903 | |
| අමාත්‍යාංශ ප්‍රදාන | 53,812,853 | |
| දික්ඕවිට ධීවර වරාය ඉදිකිරීම් අරමුදල | 3,143,094 | |
| දික්ඕවිට අරමුදල | 4,644,670 | |
| විශේෂ අත්තිකාරම්(සේවක ණය) | 15,287,022 | |
| ලැබිය යුතු එකතුකල අගය මත බදු (වැට්) | 23,498,619 | |
| වැලි ආදායම මත ලැබියයුතු එකතුකල අගය මත බදු (වැට්) | 10,434,783 | |
| තත්කාර්ය අත්තිකාරම් | 16,343,630 | |
| පෙරගෙවුම් | 36,721,143 | |

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 හා 2014 වර්ෂවල වැලි කැණීම් ව්‍යාපෘතියකට අදාළව රාජ්‍ය ආයතනයකින් ලැබිය යුතු ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.269,960 වටිනාකම එම රාජ්‍ය ආයතනය මගින් නිරවුල් කර ඇති බව 2015 මාර්තු 02 දිනැති අංක W1/C/2013/43 ලිපිය මගින් දැනුම් දී තිබුණද , එම ශේෂය තවදුරටත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) පාලන ගිණුම් වර්ෂය අවසානයේ නිරවුල් විය යුතු වුවත්, වරායන් විසින් ගෙවන ලද ජලය , විදුලිය හා දුරකථන වියදම් , පාලන ගිණුමට අදාළව 2013 වර්ෂයේ සිට රු.2,459,127 ක ලැබිය යුතු ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු බදු කුලී ආදායම් ලෙස දක්වා තිබූ රු.83,475,810 ක වටිනාකම තුළ වර්ෂ 05 ට වැඩි ශේෂය රු. 4,908,918 ක් ද , වර්ෂ 02 ත් වර්ෂ 05 ත් අතර ශේෂය රු.5,983,577 ක් ද, වර්ෂ 01 ත් වර්ෂ 02 ත් අතර ශේෂය රු.27,615,222 ක් ද වූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව අයනොවී පැවති ශේෂය රු.44,968,093 ක්ද විය.

(ඇ) සංස්ථාව විසින් රේඛීය අමාත්‍යාංශයට සහ අනෙකුත් රාජ්‍ය ආයතනවලට සපයනු ලබන ආරක්ෂක සේවා වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුළු ශේෂය රු.36,487,442 ක් වූ අතර, එම වටිනාකම තුළ වර්ෂ 05 ට වැඩි ශේෂය රු.10,323,806 ක් ද ,වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර ශේෂය රු.11,142,999 ක් ද වර්ෂ 01 ට අඩු ශේෂය රු.15,020,637 ක් ද වූ අතර , මෙම මුදල් අය කරගැනීමේ කටයුතු මන්දගාමී තත්ත්වයේ පැවතුණි.

(ඉ) වසර 05 ක කාලයක සිට පැවත එන දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ආර්ථික සේවා බදු රු.10,512,971 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) 2016 වර්ෂයේ නිලධාරීන් 15 දෙනෙකුට ලබාදී තිබූ රු.1,056,700 ක් හා 2015 වර්ෂය හා ඊට පෙර වර්ෂවල සිට පැවත එන රු.15,287,022 ක තත්කාර්ය අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් නිරවුල් කර නොතිබුණි.

(උ) නැංගුරම් ණයගැති ශේෂ රු.47,311,629 ක් තුළ මෝදර ධීවර වරායට අදාළව වසර 03 ත් වසර 05 ත් අතර හා වසර 05 ට වැඩි ණය ශේෂ පිළිවෙලින් රු.14,468,415 ක් හා රු.32,843,214 ක් පවතින අතර මෙම ශේෂ අයකරගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඌ) වසර 05 කට අධික කාලයක් ඉක්මවා ඇති කොඩ්බේ ධීවර වරායෙහි සන්කෙන් නැව ඉවත්කිරීමට අදාළව ලැබිය යුතු රු.2,150,000 ක මුදල අයකරගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද අපොහොසත් වී තිබුණි.

(එ) වසර දෙකකට අධික කාලයක සිට අයනොවී පවතින එකතුව රු.1,000,394 ක් වූ සේවක ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය තුළදීද සංස්ථාව විසින් අදාළ නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) 2014 සහ 2015 වර්ෂවලදී කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ එකතුව රු.39,873 ක වැටුප් අත්තිකාරම් ද රු.193,159 ක් වූ ගමන් වියදම් අත්තිකාරම් ද සමාලෝචිත වර්ෂය තුළදීද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.5 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 137(5) | භාණ්ඩ ලැබුණු බවට සනාථකර ගැනීමකින් තොරව 2015 වර්ෂය තුළදී ටී ෂර්ට් 600 ක් මිලදී ගැනීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.470,470 ක් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 395 (ඌ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම , චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිම සම්බන්ධයක් නොමැති නිළධාරියකු විසින්ම විය යුතු වුවද, සංස්ථාවෙහි අදාළ මුදල් පොත් පවත්වා ගැනීම සහ බැංකු සැසඳුම් පිළියෙල කිරීම එකම නිළධාරියෙකු විසින් සිදුකර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 | චෙක්පත් නිකුත් කල දිනය , එය වලංගු දිනය යන දෙකෙන් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.36,611 ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 446 (2) | මුදල් පොත්, ලැබීම් සහ ගෙවීම් අනුව කාලානුක්‍රම පිළිවෙලින් පවත්වා ගෙන යා යුතු අතර දිනපතා තුලනය කරමින් අධීක්ෂක හෝ මාණ්ඩලික නිලධාරියෙකු විසින් අත්සන් කළ යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 751 | පොදු 44 වැනි ආකෘති පත්‍රය ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වාගත යුතු වුවද ,සංස්ථාවේ වරායන් 22 ක් ඇතුළුව ප්‍රධාන කාර්යාලයේ උප කාර්යාල සඳහා වටිනාකම රු.134,136,245 ක් වූ ගෘහභාණ්ඩ කාර්යාල උපකරණ සහ අනෙකුත් උපකරණ සඳහා බඩු ලේඛන පොතක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 757(2) | සමාලෝචිත වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | වටිනාකම රු.99,705,372 ක් වූ පරිගණක හා උපාංග සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. |
| (ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | |
| (i) 2011 දෙසැම්බර් 12 දිනැති අංක 28/2011 දරන චක්‍රලේඛය | චක්‍රලේඛය ප්‍රකාරව, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට අයත් නිලධාරීන් සඳහා රු.15,000 ක දීමනාවක් හිමි වුවද, විධිමත් අනුමැතියකින් තොරව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයට ඇතුළත් නොවන සංස්ථාවේ ඉංජිනේරුවරුන් 07 දෙනෙකු සඳහා එම දීමනාව ලෙස රු.1,065,000 ක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීම්කර තිබුණි. |

| | |
|---|---|
| (ii) 2015 මැයි 25 දිනැති අංක 01/2015 දරන චක්‍රලේඛය | • සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රවාහන දීමනාව ලැබීමට හිමිකම් නොමැති නිලධාරීන් 21 දෙනෙකු සඳහා රු.5,000 බැගින් හා නිලධාරීන් 12 දෙනෙකු සඳහා රු.1,500 බැගින් එකතු වටිනාකම රු.1,476,000 ක ප්‍රවාහන දීමනා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.<br><br>• අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගැනීමෙන් තොරව සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් 2016 ජනවාරි මාසයේ සිට 2016 ඔක්තෝබර් මාසය දක්වා අනුමත ඉන්ධන සීමාව ඉක්මවා රු.401,431 ක් වටිනා ඉන්ධන ලීටර් 3820 ක් සහ ඉහළ කළමනාකරණ ශ්‍රේණියේ නිලධාරීන් විසින් රු.925,908 ක් වටිනා ඉන්ධන ලීටර් 9746.4 ක් භාවිතා කර තිබුණි. |
| (iii) 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛය | සංස්ථාවේ සාමාන්‍යාධිකාරීවරයා වෙත හා කළමනාකරණ අධ්‍යක්ෂවරයා වෙත පිළිවෙලින් රු.35,395 ක් හා රු.40,000 ක් වටිනා ජංගම දුරකථන සංස්ථා වියදමින් ලබාදී තිබුණි. |
| (ඉ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2 (බී) වගන්තිය | මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙකුට එක් අවස්ථාවකදී ලබාදිය හැකි අත්තිකාරම් මුදලෙහි උපරිම සීමාව රු.100,000 වුවත් සංස්ථාව විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 44 කදී භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතියකින් තොරව රු.100,000 සිට රු.280,000 ක පරාසයක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ඊ) 2015 ජුනි 29 දිනැති අංක PE/2015/04 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛය | පාර්ලිමේන්තු මැතිවරණ කාලසීමාව තුළදී නිලධාරීන්, සේවකයින් බඳවාගැනීම , උසස් කිරීම හා මාරු කිරීම සිදු නොකළ යුතු වුවද ඊට පටහැනිව 2015 මහ මැතිවරණ කාල සීමාවේදී සංස්ථාව විසින් පත්වීම් 20 ක් ප්‍රදානය කර තිබුණි. |
| (උ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 2.7.5 වගන්තිය | වටිනාකම රු.1,815,800 ක් සහිත බීකන් ලාම්පු මිලදී ගැනීමට අදාළ වූ ප්‍රසම්පාදන කමිටුව සඳහා අමාත්‍යාංශ නියෝජිතයෙකු සහ විෂය නිපුණතාවයක් සහිත පුද්ගලයෙකු සම්බන්ධ කර ගැනීමකින් තොරව මිලදී ගැනීම් සිදුකර තිබුණි. |
| (ඌ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 හි VII ඡේදය | වැඩ බැලීමේ පත්වීමක් උපරිම ලෙස මාස 03 කට සීමා විය යුතු වුවද සංස්ථාව විසින් නිලධාරීන් 03 දෙනෙකු එකී සීමාව ඉක්මවා වැඩ බැලීම සඳහා පත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ පමණක් වැඩ බැලීමේ වැටුප් ලෙස එකතුව රු.99,416 ක් ගෙවා තිබුණි |

## 3. මූල්‍ය සමාලෝචනය

---

### 3.1. මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.31,396,138 ක අලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.128,779,340 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභය රු.97,383,202 කින් අඩු වී තිබුණි. පරිපාලන වියදම් හා කාර්ය මණ්ඩල පිරිවැය පිළිවෙලින් රු.10,385,884 කින් හා රු.42,103,239 කින් වැඩිවී තිබුණද පුනරාවර්තන ප්‍රදාන රු.81,067,315 කින් හා මෙහෙයුම් ආදායම් රු.71,136,645 කින් වැඩිවීම ඉහත අලාභය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම අඛණ්ඩව අලාභ ලබා තිබුණද එම අලාභය රු.258,826,672 ක සිට රු.31,396,138 ක් දක්වා අඛණ්ඩව අඩුවී තිබුණි. කෙසේ වුවද , මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේදී රු.259,109,586 ක් වූ සංස්ථාවේ දායකත්වය අඛණ්ඩව ධන අගයක් සහිතව වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.813,998,510 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

ඉකුත් වසර 05 තුළ සංස්ථාවේ මුළු ආදායමෙන් රාජ්‍ය ප්‍රදානවල දායකත්වය සියයට 44.36 සිට සියයට 88.66 දක්වා වැඩිවී තිබුණු අතර ස්වයං උත්පාදිත ආදායම්වල දායකත්වය සියයට 55.63 සිට සියයට 11.34 දක්වා අඩුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 කාර්ය සාධනය

---

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 2 වන වගන්තිය හා 1997 මාර්තු 06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි සංශෝධිත ප්‍රධාන අරමුණු පහත දැක්වේ.

- ධීවර වරායන් , නැංගුරම් පොලවල්, මුහුදු ව්‍යුහයන් සහ අනෙකුත් වෙරළ පහසුකම් සැලසුම් කිරීම, සැලසුම් නිර්මාණය කිරීම, ඉදිකිරීම පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම , පාලනය , නඩත්තු කිරීම , කළමනාකරණය කිරීම සහ එමගින් ධීවර කාර්මිකයන්ට හා අනෙකුත් පුද්ගලයන්ට සපයනු ලබන පහසුකම් සඳහා පොදු වරාය ගාස්තු නියම කිරීම සහ අයකිරීම.

- ධීවර යාත්‍රා සඳහා අලුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම.

- ශීතාගාර, අයිස් යන්ත්‍රාගාර සහ අනෙකුත් ශීතාගාර පහසුකම් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

- ජලය , ඉන්ධන , ලිහිසි තෙල් , විදුලිය , අයිස් හා ශීතාගාර පහසුකම් සැපයීම සහ ධීවර කර්මාන්තය උදෙසා සහ ධීවර කාර්මිකයින්ට ආනුෂාංගික වන අනෙකුත් සේවාවන් සැපයීම.

- ධීවර වරායන් , නැංගුරම් පොලවල් , මුහුදු ව්‍යුහයන් , ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය තුළට ගැනෙන අනෙකුත් සංවිධානවලට ආරක්ෂක සේවා විධිවිධාන සැලසීම සහ ඒ වෙනුවෙන් ගාස්තු , කුලී සහ වෙනත් ගෙවීම් අය කිරීම.

- ශ්‍රී ලංකා අනන්‍ය ආර්ථික කලාපය පිළිබඳ මෙහෙයුම් , පාලන සහ ආවේක්ෂණ කටයුතු කිරීම.

ධීවර යාත්‍රා සඳහා අළුත්වැඩියා සහ නඩත්තු පහසුකම් සැපයීම සංස්ථාව පිහිටුවීමේ අරමුණක් වුවද එම අරමුණ ඉටුකර ගැනීමට සංස්ථාව විසින් කටයුතුකර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩාගාර අනුමැතියට අනුව සංස්ථාවට ලබාගත හැකි උපරිම අයිරා වටිනාකම රු.මිලියන 25 ක් වුවද, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 40 ක් දක්වා අයිරා පහසුකම් ලබාගෙන තිබුණු අතර , අයිරා පොළී ලෙස රු.2,821,768 ක් ගෙවා තිබුණි.

(ආ) සංස්ථාවට අයත් සයුරි යාත්‍රාව කුලී පදනම මත ලබා දීමට අදාළව 2016 වර්ෂයේ පෙබරවාරි 23 දින පෞද්ගලික සමාගමක් සමග එළඹ තිබූ ගිවිසුම ප්‍රකාරව, අදාළ යාත්‍රාව සන්තකයේ තබාගත් දිනකට රු.200,000 ක් බැගින් සමාලෝචිත වර්ෂයේ දින 28 ක් සන්තකයේ තබාගැනීම වෙනුවෙන් එකතුව රු.5,200,000 ක් අයකරගත යුතු වුවත්, ඉන් රු.1,600,000 ක් පමණක් අයකරගෙන තිබුණි. ඒ අනුව ගිවිසුම් කොන්දේසි වලට අනුව තව දුරටත් අයකරගතයුතු ඉන්ධන, ජලය, සේවක වැටුප්, අතිකාල හා දීමනා රු.1,409,960 ක් ද ඇතුළුව එකතුව රු.5,009,960 ක් අයකර ගැනීමට 2016 මැයි මාසය වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට කල්බදු ක්‍රමයට අලුතෙන් වාහන මිලදී ගැනීම සඳහා රු.මිලියන 16 ක ප්‍රතිපාදන සළසා තිබියදී , එසේ මිලදී නොගෙන එම මුදලින් රු.මිලියන 11.7 ක් වැයකර සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාවේ පැරණි වාහන අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකර තිබුණි.

(ඉ) අමාත්‍යාංශය විසින් ධාවනයෙන් ඉවත්කරන ලද වසර 20 කට වඩා පැරණි ඩබල් කැබ් රථය අයිතිය පවරාගැනීමෙන් තොරව 2015 ජූලි 14 සිට 2016 සැප්තැම්බර් 02 දක්වා කාලය තුළ රු.553,572 ක් වැයකර සම්පූර්ණ අලුත්වැඩියාවක් සිදුකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අගෝස්තු දක්වා කිලෝමීටර් 15,640 ක් පමණක් ධාවනය කර තිබූ අතර නැවතත් මෙම වාහනයේ එන්ජිම අලුත්වැඩියා කිරීමට සිදුවීම හේතුවෙන් ප්‍රධාන කාර්යාල භූමිය තුළ නවතා තිබූ බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඊ) 2007 වර්ෂයේදී නිකුත් කළ අභ්‍යන්තර විගණන වාර්තාවකට අනුව, සැපයුම් අංශයෙහි රාජකාරී කටයුතු භාරව සිටියදී රජයේ මුදල් අවභාවිතා කිරීමට සම්බන්ධ ලිපිකරු නිලධාරිණියකගෙන් රජයට සිදුවූ පාඩුව අයකර ගැනීමකින් හා විනය පරීක්ෂණයකින් තොරව 2014 මැයි 05 සිට ඇය නැවත එම අංශයටම අනුයුක්ත කර තිබුණි.

(උ) 2016 වර්ෂයට අදාළව විගණන විමසුම් 05 කටත් පිළිතුරු සපයා නොතිබුණි.

(ඌ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.2 වගන්තිය අනුව, සෑම රජයේ ව්‍යාපාරයකම එහි වාර්ෂික කාර්යසාධනය ඇගයීමට සහ අධීක්ෂණය කිරීමට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ යුතු වුවත් සංස්ථාව ඊට අනුකූල වී නොතිබුණු අතර එහි කාර්යසාධනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය නිසි අධීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(එ) සංස්ථාව විසින් ඉදිරිපත් කර ඇති 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සංයුක්ත සැලැස්ම අනුව ලාභ ලැබීමට අපේක්ෂා කර තිබුණද , එකී කාලය තුළ අඛණ්ඩව අලාභ ලබා තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 වගන්තිය ප්‍රකාරව අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම තහවුරු කරගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව ඵලදායී පියවර ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය හා ඉහළ කළමනාකාරීත්වයේ අවධානය යොමුවී නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආසියානු සංවර්ධන බැංකුවේ හා වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ආධාර මත රු.මිලියන 224 ක වියදමින් ඉදිකර සංස්ථාව වෙත ලබා දී ඇති හලාවත ධීවර වරායේ මෙහෙයුම් කටයුතු 2009 වර්ෂයේදී ආරම්භ කර තිබූ නමුත් 2017 මැයි මාසය දක්වා ධීවර වරායකින් ඉටුවිය යුතු මූලික අරමුණ වන ධීවරයන්ට සහන සැලසීම සිදුවී නොතිබුණි. 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා වරායේ මෙහෙයුම් කටයුතු වලින් සිදුවූ අලාභය රු.53,777,748 ක් වූ බැවින් ණය ආධාර මත ඉදිකළ මෙම වරාය වෙනුවෙන් ගෙවීමට ඇති විදේශීය ණය හා ඊට අදාළ පොළිය ගෙවීම රජයට වැය බරක් වී තිබුණි.

(ආ) කිරින්ද වරායේ වැලි ඉවත්කිරීම සඳහා 2015 වර්ෂයේ ජුනි මාසයේදී සංස්ථාව සමග පෞද්ගලික ආයතනයක් ගිවිසුම් ගතවී තිබූ අතර, එම ආයතනය ගිවිසුම ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. ගිවිසුමේ වගන්ති අංක 08 අනුව ගිවිසුම අවලංගු කර රු.200,000 තැන්පතුව ආයතනයට පවරාගැනීම සිදු කිරීමකින් තොරව හම්බන්තොට වරායේ වැලි ඉවත්කිරීමේ කටයුතු ද 2015 වර්ෂයේ අගෝස්තු සිට එම ආයතනයටම පවරා දී තිබූ අතර එම කාර්යයද අතහැර දමා තිබුණි. ඒ හේතුවෙන් ධීවර යාත්‍රා වලට වරායට ළඟා වීමට නොහැකි වීම හා ධීවරයන්ට පහසුකම් සැපයීම යන අරමුණ ඉටු වී නොතිබුණ අතර මේ සම්බන්ධයෙන් කළමනාකරණයේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) සංස්ථාව යටතේ ක්‍රියාත්මක වූ ධීවර වරායන් 21 න් වරාය 15 ක් ම සමාලෝචිත වර්ෂය තුළ රු.170,740,291 ක මෙහෙයුම් අලාභ ලබා තිබූ අතර, එම වරායයන් සියල්ලම ඉකුත් වර්ෂයේදීද අලාභ ලබා තිබුණි. පුරාණවැල්ල , කුඩාවැල්ල, හලාවත, තංගල්ල හා නිල්වැල්ල ධීවර වරායන්හි මෙහෙයුම් අලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 104 , සියයට 328 , සියයට 35 , සියයට 18 ක් හා සියයට 10 කින් වැඩිවී තිබුණි. අලාභ ලබන වරායන්වල අලාභ ලැබීමට හේතුන් අධ්‍යයනය කර ලාභ ලබන තත්ත්වයකට ගෙන ඒම හෝ අලාභ අඩුකර ගැනීම හා ලාභය අඩුවෙමින් පවතින වරායන්වල එය වැඩිකරගැනීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු වී නොතිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පානදුර වරායේ වැලි ඉවත්කිරීම සඳහා 2014 වර්ෂයේදී අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම් ගතවී ඇප සුරක්ෂණයක්ද ලබාගැනීමකින් තොරව රු.20,000,000 ක් ලබාදී තිබුණි. ගිවිසුම් කොන්දේසි අනුව කැණීම් කරන ලද වැලි විකුණා ලැබෙන මුදලින් කැණීම් ගාස්තු හිලව්කළ යුතු වුවද වැලි කැනීම් සිදු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එකී මුදල් අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂ 05 තුළ මුළු මෙහෙයුම් ලාභයෙන් සියයට 73 ක් ඉපැයූ මෝදර ධීවර වරාය, 2014 ඔක්තෝබර් 30 දින සිට වසර 25 ක කාලයකට පෞද්ගලික ආයතනයකට කල්බදු පදනමට ලබාදී තිබුණි. ඒ අනුව හෙක්ටයාර් 1.421 ක් වූ ඉඩම හා එහි ගොඩනැගිලි බදු දීමේ රජයේ තක්සේරුව රු.1,700,000 ක් වුවද එය නොසලකා මාසිකව රු.125,000 බැගින් බදු දී තිබීම හේතුවෙන් 2016 වර්ෂය තුළදී පමණක් රු.18,900,000 ක් සංස්ථාවට අහිමි වී තිබුණි.

(ඇ) කොඩ්බේ ධීවර වරාය සතු ටොන් 100 ක දියත් මඟ, මාස 06 ක් තුළ අලුත්වැඩියා කර බදු පදනම මත භාවිතා කිරීම සඳහා පෞද්ගලික පාර්ශවයකට භාර දී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මාස 06 ක බදු මුදල්වලට අළුත්වැඩියා වියදම් හිළව් කර තිබුණද වර්ෂ 03 ක් ඉක්මවා ගොස් තිබියදීත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමකින් තොරව දියත් මඟ භාවිතා කරමින් පැවතුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------------

වර්ෂ 06 කට වැඩි කාලයක සිට වටිනාකම රු.312,804 ක් වූ බැංකු ගිණුම් 06 ක ශේෂ අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

**4.6 හඳුනාගන්නා ලද පාඩු**

-------------------------

හික්කඩුව ධීවර වරායේ යාත්‍රා කරමින් තිබියදී 2016 නොවැම්බර් 06 දින අනතුරකට පත්වූ සයුරි යාත්‍රාව රක්ෂණය කර නොතිබීම හේතුවෙන් අනතුරින් පසුව සිදුකල අළුත්වැඩියා වෙනුවෙන් දරන ලද රු.5,800,000 කින් ආයතනයට අලාභයක් සිදුවී තිබුණි.

**4.7 විධිමත් පරිදි පවරා නොගත් ඉඩම්**

-------------------------------------

සංස්ථාව යටතේ ක්‍රියාත්මක ධීවර වරායන් 21 න් වරායන් 06 කට අදාළ ඉඩම් පමණක් පවරාගෙන තිබුණු අතර, අනෙකුත් වරායන්හි ඉඩම් පවරා ගැනීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකර මෙහෙයුම් කටයුතු පවත්වාගෙන ගොස් තිබුණි.

**4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සංස්ථාවේ සම්පත්**

------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව සතු වාහන 05 ක් අමාත්‍යවරයාගේ කටයුතු වෙනුවෙන් රියදුරන්ද සහිතව නිදහස් කර තිබුණු අතර ඒ වෙනුවෙන් සංස්ථාව විසින් ඉන්ධන සහ රියදුරු වැටුප් වශයෙන් එකතුව රු.720,595 ක් වැයකර තිබුණි.

(ආ) අමාත්‍යවරයාගේ නිල නිවස අලුත්වැඩියාව සඳහා 2016 වර්ෂය තුළදී රු.13,585,685 ක් වැයකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට ප්‍රතිපූර්ණය නොවූ රු.3,723,677 ක් ලැබිය යුතු ශේෂ ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රේඛීය අමාත්‍යාංශයට සහ වෙනත් රජයේ ආයතන වලට සේවකයන් 19 ක් මුදාහැර තිබුණු අතර ඒ සඳහා රු.11,469,168 ක වැටුප් ගෙවා තිබුණද අදාළ වැටුප් එම ආයතන මගින් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 8.2 වගන්තිය ප්‍රකාරව සේවයෙන් පහකළ නිලධාරියෙකු යළිත් සේවයට නොගන්නා බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා වගබලා ගතයුතු වුවද ඊට පටහැනිව 2012 ජනවාරි 04 වන දින සිට මානව සම්පත් කළමනාකරණ තනතුර සඳහා රජයේ ආයතනයකින් විධිමත් විනය පරීක්ෂණයකින් සේවයෙන් පහකළ නිළධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන චක්‍රලේඛයේ 09 වන පරිච්ඡේදයට පටහැනිව කටයුතු කල අවස්ථා පහත පරිදි නිරීක්ෂණය විය.

(i) 9.3.1 වගන්තිය ප්‍රකාරව සංස්ථාව සඳහා සේවකයන් බඳවාගැනීම හා උසස් කිරීමට අදාළ බඳවාගැනීමේ පටිපාටිය සමාලෝචිත වර්ෂය දක්වා අනුමත කරගෙන නොතිබුණි.

(ii) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 ප්‍රකාරව වැටුප් සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමකින් තොරව මූල්‍ය කළමනාකාර තනතුර සඳහා වැටුප් වර්ධක 34 ක් ද කණිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරක් වන පෞද්ගලික සහකාර තනතුර සඳහා පරිවාස කාලය ඉක්මවීමටත් පෙර වැටුප් වර්ධක 15 ක් ද එකවර පිරිනමා තිබුණු අතර අභ්‍යන්තර විගණක හා විගණන නිලධාරී තනතුරුද නිවැරදි නොවන වැටුප් තලවල පිහිටුවීම සහ නීති නිලධාරීන් දෙදෙනෙකු වෙත මාසයකට රු.10,000 බැගින් විශේෂ දීමනාද ගෙවා තිබුණි.

(ඇ) 2010 අගෝස්තු 02 දින කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති සම්බන්ධීකාරක තනතුරට වසරක කාලයක් සඳහා බඳවාගත් නිලධාරියෙකු , සංස්ථාවේ පවතින බඳවාගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියට පටහැනිව මාසයක් තුළ නියෝජ්‍ය කළමනාකාර තනතුරට පත්කර තිබුණි. ඒ අනුව , කොන්ත්‍රාත් කාලය තුළ ඔහුගේ කාර්යක්ෂමතාව හා යෝග්‍යතාවය පරීක්ෂාවට ලක් කිරීමකින් තොරව 2012 ජනවාරි 06 දින රු.21,255 ක වැටුප් පියවරෙහි තබා සේවය ස්ථිර කර තිබුණි.

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තියට පටහැනිව අනුමත තනතුරු වලින් පරිබාහිරව සහ නියමිත බඳවාගැනීමේ පටිපාටීන්ට පටහැනිව පත්වීම් 349 ක් ප්‍රදානය කර තිබුණි.

## 4.10 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති පරිදි ස්වකීය රාජකාරී හා වගකීම් ඉටුකිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුළ ශක්තිමත් අභ්‍යන්තර විගණක ඒකකයක් පිහිටුවා ගත යුතු වුවත්, ධීවර වරායයන් 21 කින් සමන්විත ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි අභ්‍යන්තර විගණන අංශයෙහි 2013 වර්ෂයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වී පවතින අතර, ඒ සඳහා බඳවාගැනීමට පාලනාධිකාරිය ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ආ) විගණන නිලධාරීන් දෙදෙනෙකුගෙන් සහ කළමනාකරණ සහකාර තිදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන අංශය සඳහා 2016 නොවැම්බර් වන විට වැටුප් හා වේතන වශයෙන් රු.15,034,728 ක් ගෙවා තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන වාර්තා 03 ක් පමණක් නිකුත් කර තිබුණි. තවද, කළමනාකරණය විසින් එකී වාර්තා සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව, අභ්‍යන්තර විගණන අංශයක ප්‍රධාන පරමාර්ථයක් ලෙස දෙපාර්තමේන්තුවෙහි මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතු වල වැරදි හා වංචා වැළැක්වීම සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යැම දක්වා තිබුණද,මෙම අංශය මගින් එම අරමුණ ඉටුකරගැනීමට ප්‍රමාණවත් හා පිළිගත හැකි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2009 ජුනි 06 දිනැති ඩීඑම්ඒ අංක 2009/01 චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශය වර්ෂයක් තුළ මූලික හා සාරාංශ වාර්තා දෙකක්ද,කාර්තුමය වාර්තා හතරක්ද සකස්කර එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඩී/2009/02 වගන්තිය ප්‍රකාරව රජයේ වත්කම් වාර්තාගත කිරීම හා අභ්‍යන්තර පාලනය පිළිබඳ අභ්‍යන්තර විගණන ක්‍රියාපටිපාටීන් සකස්කළ යුතු වුවද, 2014 සිට 2016 වර්ෂය දක්වා මෙම ආයතනයෙහි වත්කම් සම්බන්ධයෙන් විධිමත් වාර්තාවක් විගණිත දිනය වන විටද සකස්කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 03 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව , අදාළ ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිට ඉදිරිපත්කර තිබුනේ දින 58 ක් ප්‍රමාදවී 2017 අප්‍රේල් 27 දින දීය.

### 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2014 අනුව අවම වශයෙන් වසර 03 ක් සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කළයුතු වුවත් , ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් 2016 වර්ෂයේ සිට ඉදිරි කාලපරිච්ඡේද සඳහා වූ සංයුක්ත සැලැස්ම විගණන දිනය වන 2017 අප්‍රේල් මාසය වන විටත් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව සංයුක්ත සැලැස්ම පදනම්කරගෙන ඉදිරි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබූ අතර පිළියෙල කර තිබූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. තවද , එක් එක් ක්‍රියාකාරකම වෙනුවෙන් වූ අරමුණු , විෂය පථය සහ අපේක්ෂිත ප්‍රතිඵලය ඇතුළත් විස්තරාත්මක සැලසුම් සහ අයවැය වාර්තා ඇතුළත්කර එය පිළියෙලකර නොතිබීම හේතුවෙන් විධිමත් පාලනයක් පවත්වා ගැනීමට නොහැකි වී තිබුණි.

## 5.3 අයවැය පාලනය

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය ප්‍රකාරව අයවැය ලේඛනය තුළ ඉදිරිපත් කළයුතු වර්ෂය අවසානයට අයවැයගත ශේෂ පත්‍රය, වර්ෂය සඳහා අයවැයගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය , ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් ප්‍රකාශනය, ඇස්තමේන්තුගත ප්‍රාග්ධන වියදම සමග ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(ආ) අයවැයගත වියදම්, තථ්‍ය වියදම් සමග සැසඳීමේදී සියයට 20 සිට සියයට 490 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2014 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2017 ඔක්තෝබර් 02 දින වන විටත් සභාගත කර නොතිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

--------------------------------

2014 පෙබරවාරි 18 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් ලබා දී තිබූ පහත සඳහන් නියෝග ඉටුකර නොතිබුණි**.**

(අ) පාඩු ලබන වරායන් ලාභ ලබන තත්ත්වයට පත්කර ගැනීම සඳහා කමිටුවක් පත්කර ඊට විසඳුම් සොයා ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට උපදෙස් දී තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය හා වෙනත් ආයතන වෙත නිදහස් කර තිබූ සංස්ථා සේවකයින් 31 දෙනා සම්බන්ධයෙන් ලබාගෙන ඇති අනුමැතිය, සේවාව නැවැත්වීම පිළිබඳ වර්තමාන තත්ත්වය ඉදිරිපත් කර නොතිබුණි. කමිටු තීරණයට පටහැනිව 2016 වර්ෂය අවසාන වන විටද සේවකයන් 19 දෙනෙකු සඳහා තවදුරටත් රු.11,469,168 ක වැටුප් ගෙවා තිබුණි.

(ඇ) ණය පදනම මත සපයන ලද ඉන්ධන සඳහා අයකරගැනීම හා නඩු 10 ක් විභාගවීම පිළිබඳව හා අයකරගත් ණය ශේෂ සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ වාර්තාවන් විගණනයට ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණද මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ණයට ඉන්ධන සැපයීම නතර කරන ලෙස දන්වා තිබුණද එකී කමිටු තීරණයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂය වන විට සහ ඉකුත් වර්ෂ 02 සඳහා රු.මිලියන 69 ක ඉන්ධන ණය පදනම මත නිකුත් කර තිබුණි.

(ඉ) මෝදර ධීවර වරායේ නැංගුරම් ලා තිබූ යාත්‍රාවෙන් නැංගුරම් ගාස්තු රු. 5,675,373 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) නව බඳවාගැනීමේ පරිපාටිය සකස්කර අමාත්‍ය මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කිරීමට උපදෙස් දී තිබුණද 2014 සිට 2017 වර්ෂය දක්වාම බඳවාගැනීමේ පටිපාටි සකස්කර අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(උ) භාණ්ඩාගාර චක්‍රලේඛ වලට පටහැනිව වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් කළමනාකරණය විසින් එකී වැරදි නිවැරදි කිරීමට ගෙන ඇති පියවර විගණනයට ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද වසර 04 ක කාලයක් ගතවී ඇතත් එම කමිටු තීරණ අනුව නිවැරදි වැටුප් කාණ්ඩ සැකසීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) පෙර ගෙවුම් අත්තිකාරම් ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තාවක් සහ කමිටු තීරණ ක්‍රියාත්මක නොකිරීමට හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(එ) වටිනාකම රු.5,065,075 ක් වූ ඉන්ධන ටැංකි 06 ක් සැපයීම සඳහා 2007 වර්ෂයේදී රු.2,791,215 ක අත්තිකාරම් ගෙවා තිබුණද මෙතෙක් එම ඉන්ධන ටැංකි සංස්ථාවට නොලැබීම පිළිබඳව ඊට වගකිව යුතු සැපයුම් කළමනාකරුට එරෙහිව කටයුතු කිරීමට උපදෙස් දී තිබුණද එකී උපදෙස් අනුව , විනය පරීක්ෂණයක් නොමැතිව සහ ගෙවූ මුදල් අයකරගැනීමෙන් තොරව එම සැපයුම් කළමනාකරු නැවත සේවයේ පිහිටුවා තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) සේවක ණය කළමනාකරණය | | එකතු වටිනාකම රු.51,872,213 ක්වූ සේවක ණය, වැටුප් අත්තිකාරම් ණය හා වෛද්‍යාධාර ණය සම්බන්ධයෙන් වූ ණය ලේඛන විධිමත් පරිදි පවත්වා ගෙන නොයාම. |
| (ආ) මූල්‍ය පාලනය | (i) | බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ ප්‍රමාදයන් පැවතීම. |
| | (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය බලතල පැවරීමේ සීමාවන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මූල්‍ය වර්ෂය ආරම්භවී මාස 03 ක ප්‍රමාදයකින් පසුව ලබාගෙන තිබීම. |
| | (iii) | වර්ෂ ගණනක සිට පැවත එන හඳුනානොගත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් ශේෂ හඳුනාගෙන අයකර ගැනීමට හා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම. |

| | |
|---|---|
| (iv) | එක් එක් ණයගැතියන්ට අදාළව අගරු වෙක්පත් ඒ ඒ ණයගැතියන් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම. |
| (v) | බැංකු අයිරා පහසුකම් ලබාගත යුතු සීමාව ඉක්මවා අයිරා ගැනීම නිසා අයිරා පොළී විශාල වශයෙන් ගෙවීමට සිදුවී තිබීම. |
| (ඈ) ගිණුම්කරණය | මූල්‍ය ප්‍රකාශන නියමිත කාලවකවානු තුළ විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. |
| (ඈ) ආදායම් පාලනය | ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම. |
| (ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවාගැනීමේ පරිපාටි අනුමත කරගෙන නොමැති වීම හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව වැටුප් වැඩිවීම් හා බඳවාගැනීම් සිදුකර තිබීම සහ බඳවාගැනීම් විනිවිදභාවයකින් තොරව සිදු කිරීම, |
| (ඊ) වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොමැතිවීම හා වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සිදුකර නොතිබීම. |
| (උ) අභ්‍යන්තර විගණනය | ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුනොවීම හා අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී නොතිබීම. |